# අත්තම්මාගේ උපන්දිනය



තනුරි හංසනා බණ්ඩාර

# අත්තම්මාගේ උපන් දිනය

තනුරි හංසනා බණ්ඩාර

# පිළුම

නොදන්නා දේ කියා දෙමින්

ඉගෙනීමේ කටයුතු වලදී

මෙන්ම

විෂය බාහිර ක්‍රියාකාරකම්

සඳහාද

නිබදව අපව දිරි ගන්වමින්

ආදරයෙන්

සිප් සතර උගන්වන

මාගේ ආදරණීය

පන්තිභාර ගුරු මෑණියන්ට

සෙනෙහෙ සිතින් පුදමි !

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ළදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 ' 11 ' 01

ස්වීඩනයේ ඈත ගමක සින්ඩි නමින් කුඩා ගැහැණු ළමයෙක් සිටියා. ඇය ජීවත් වුණේ ඇගේ අත්තම්මා සමග කුඩා නිවසකය.



සින්ඩිගේ දේමාපියන් ඇය දමා ගියේ සින්ඩි ඉපදී මාස ගණනකිනි. අත්තම්මා සින්ඩිව හදා ගත්තේ පාර වල් අතු ගාමින් ලබා ගත් සුළු මුදලකිනි.

සින්ඩි පාසල් ගොස් හොඳින් ඉගෙනීමේ කටයුතු සිදු කළා. තනිව නිවසට පැමිණ අත්තම්මා එන තුරු හැමදාම හවස් වන තෙක් බලා සිටියා.



එදා සින්ඩිට විශේෂ දිනයකි අත්තම්මාගේ උපන්දිනය යෙදී තිබුණ දවසයි.

සින්ඩි උදෑසන අවදි වී අත්තම්මාට සුභ පැතුවද අත්තම්මාට දීමට ඇය තුළ කිසිවක් නොමැති බැවින් සින්ඩි දුක් වුවාය.

වෙනදා මෙන්ම පාසල් ගිය සින්ඩි උනන්දුවෙන් ගෙදරට පැමිණියේ අත්තම්මා පුදුම කිරීමට යමක් කළ යුතු යැයි සිතමිණි.

ගෙදරට පැමිණී සින්ඩි ඉක්මනින් අසල පිහිටි කුඩා කැලයකට ගොස් බ්ලු බෙරි ගෙඩි කූඩයකට කඩා ගත්තාය.



ඉක්මනින් වෙළඳසැලට ගොස් ඒවා විකුණා මුදල් ලබා ගත්තාය. අසල පිහිටි බේකරියකට ගොස් කුඩා කේක් ගෙඩියක් සහ සැරසිලි කිහිපයක් මිලදී ගෙන ගෙදරට දිව ආවාය.

අත්තම්මා ගෙදර එන වෙලාවට සින්ඩි මේසය උඩ කේක් ගෙඩිය තබා ලස්සනට සැරසුවා.

අත්තම්මා දොර අරින විටම පුදුමයට පත්වී සින්ඩිව තුරුලු කර ගත්තා. දෙදෙනාම එකතු වී කේක් කපා සතුටින් විනෝද වුණා.

එ දවස සින්ඩිට කවදාවත් අමතක නොවන දවසක් වුණා.



# ස්තූතිය !

මා කුඩා කාලයේ සිට මා හට

ඉගෙනීම සඳහා නිබදව දිරි

ගන්වමින්ද අකුරු කියා දෙමින්ද

සියළු අවශ්‍යතා සපුරාලමින්ද

මෙම පොත ලිවීමට දිරි ගැන්වූ

මාගේ ආදරණීය අම්මා සහ

අප්පච්චි ට මෙන්ම මාගේ

ආදරණීය අක්කි ඔවිනිට මෙන්ම

මා හට සිප්සතර උගන්වන

මාගේ ආදරණීය ගුරු මෑණියන්ට

මාගේ හද පිරි ස්තූතිය පුද කරමි.

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක



